**නිපුණතා මට්ටම 6.4 - සමාහාර ඉල්ලුම් සංරචක වෙනස්වීම මත සාර්ව ආර්ථික සමතුලිතය වෙනස්වීම ගුණක ක්‍රියාවලිය ඇසුරින් පෙන්වා දෙයි.**

සාර්ව ආර්ථික සමතුලිතය වෙනස්වීමට පහත සඳහන් සාධක බලපායි.

1.පරිභෝජන ශ්‍රිතය වෙනස්වීම.
2.ස්වාධීන ආයෝජන වෙනස්වීම.
3.රාජ්‍ය මිළදී ගැනීම් වෙනස් වීම.
4.ස්වාධීන බදුවල වෙනස්වීම.
5.සංක්‍රාම වියදම් වෙනස්වීම.

ස්වාධීන පරිභෝජනය හෝ ආන්තික පරිභෝජන නැමියාව හෝ වෙනස්වීම අනුව පරිභෝජන ශ්‍රිතය වෙනස් වේ.මෙම නිසා ස්වාධීන පරිභෝජනය හෝ ආන්තික පරිභෝජන නැමියාව වෙනස්වීම අනුව සාර්ව ආර්ථික සමතුලිතයද වෙනස් වේ.

- ස්වාධීන වියදමේ සංරචකයක් වෙනස්වීම නිසා සමතුලිත ආදායමේ ඇතිවන වෙනස්වීම විග්‍රහ කරන්නේ ගුණක ක්‍රියාවලියෙනි.ස්වාධීන වියදමේ වෙනස්වීම නිසා ආදායම් මට්ටම කිහිප ගුණයකින් වෙනස්වීම “ගුණක ප්‍රතිවිපාකය” ලෙස හැඳින්වේ.
- සාමාන්‍යයෙන් සරල ආර්ථිකයක ගුණකය පහත පරිදි දැක්විය හැකිය.

  K=1/(1-b)
  =1/(1-MPC)
  =1/(MPS)

  රජය ඇතුළත් ආර්ථිකයක ස්වායත්ත වියදම් වර්ග තුනකි.
  1.පරිභෝජන වියදම
  2.ආයෝජන වියදම
  3.රජයේ පරිභෝජන වියදම

## අභ්‍යාස

1.) ගුණකයෙහි විවිධ ස්වරූප වන
  1.පරිභෝජන වියදම් ගුණකය
  2.ආයෝජන වියදම් ගුණකය
  3.රජයේ වියදම් ගුණකය

4.බද්ධ ගුණකය
5.සංක්‍රාම ගුණකය
6.තුලිත අයවැය ගුණකය
ආදිය ගණනය කරන ආකාරය උදාහරණ සහිතව දක්වන්න.